# භූගෝලීය තොරතුරු ඇතුලත් සිතියම් සංග්‍රහය

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## කුරුවිට

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුවිට

**සංකල්පය හා මගපෙන්වීම**

**දිලිනි ධර්මදාස, ප්‍රාදේශීය ලේකම්,**

**කුරුවිට**

**අධීක්ෂණය හා සම්බන්ධීකරණය**

**ටී.ඩී.නිහාල්, සහකාර ප්‍රාදේශීය ලේකම්,**

**කුරුවිට**

**සම්පාදනය**

**ඩබ්.එම්.දීපිකා දමයන්ති කුලසිංහ,**

**ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී,**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**

**කුරුවිට**

ප්‍රාදේශීය ලේකම් තුමියගෙන් .........

සේවාලාභී තෘප්තිය තුළින් විශිෂ්ටත්වයට යන දැක්ම සාක්ෂාත් කර ගැනීමේ අරමුණ පෙරදැරිව, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අපි රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව සේවා සැපයීම, සම්පත් සම්බන්ධීකරණය හා ජනතා සහභාගීත්වයෙන් යුත් කාර්යක්ෂම, තිරසාර හා සැලසුම් සහගත සංවර්ධනයක් තුලින් ප්‍රදේශයේ ජන දිවියට සවියක් වීමේ මෙහෙවර උදෙසා අත්වැල් බැඳගෙන කටයුතු කරමින් සිටිමු.

මෙහිදී විවිධ පැතිකඩයන් මෙන්ම ක්ෂේත්‍ර ඔස්සේ සේවා සැපයීමට අවශ්‍ය වන්නා වූ විවිධ ආකාරයේ දත්ත හා තොරතුරු පද්ධති ගොඩ නගා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. විශේෂයෙන්ම අධ්‍යාන කටයුතු, සැලසුම් සම්පාදනය හා තීරණ ගැනීම්, පර්යේෂණාත්මක මෙන්ම ගවේෂණාත්මක කටයුතු, වාර්තාකරණ කටයුතු වැනි අවස්ථා වලදී කොට්ඨාසයේ විවිධ වූ දත්ත හා තොරතුරු ඉතාමත් වැදගත් වෙයි. මෙහිදී කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව භූ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් සිතියම් එකතුවක අවශ්‍යතාවය පෙනී යන ලදී. ඒ අනුව අප කාර්යාලයේ සේවයේ නියුතු ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී ඩබ්.එම්.දීපිකා දමයන්ති  මහත්මිය විසින් මෙම ක්ෂේත්‍රයට අදාළ එතුමිය සතු විෂය දැනුම මනා ලෙස උපයෝගී කර ගනිමින් මෙම භූගෝලීය තොරතුරු ඇතුලත් සිතියම් සංග්‍රහය සම්පාදනය කරන ලදී. ඒ පිළිබඳ මගේ සුභාශිංසන පිරිනමන අතර, මෙම කාර්ය සාර්ථක කර ගැනීම උදෙසා සහකාර ප්‍රාදේශීය ලේකම් ටී.ඩී. නිහාල් මහතා ලබා දුන් මගපෙන්වීම ද අගය කරමි.

මෙම සිතියම් සංග්‍රහය පරිශීලනය කරමින් මෙහි අඩංගු තොරතුරු කොට්ඨාසයේ භෞතික මෙන්ම මානව සංවර්ධනයට යොදා ගනිමින්, සාර්ථකත්වයට ලඟා වනු දැකීම අපගේ අපෙක්ෂාව වේ......

දිලිනි ධර්මදාස,

ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

කුරුවිට

## සම්පාදකගෙන් ........

විසිඑක්වන සියවසෙහි තාක්ෂණික පෙරලියත් සමඟ විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා දත්ත හා තොරතුරු භාවිතයට ගැනීම ප්‍රමුඛ වී ඇත. ඒ අනුව සිතියම් පාදක කර ගත් දත්ත හා තොරතුරු, අධ්‍යන කටයුතු, ගවේශන කටයුතු, සැලසුම්කරණ කටයුතු මෙන්ම වාර්තාකරණ කටයුතු වැනි බොහෝ කාර්යයන් සඳහා මහඟු පිටුවහලක් වනු ඇත. මේ අනුව කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ සිතියම් දත්ත හා තොරතුරු පිළිබඳව විවිධ පාර්ශවයන් විසින් විමසීම් සිදු කරන අතර, එහිදී එම දත්ත පහසුවෙන් ලබා දිය හැකි පරිදි සකසන ලද සිතියම් එකතුවක අවශ්‍යතාවය පෙනී යන ලදී.

ඒ අනුව පවත්නා සම්පත් ඇසුරින් මෙම කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ සිතියම් සංග්‍රහය සම්පාදනයට කටයුතු කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීමේ සිට එහි භූ විද්‍යාත්මක, පාරිසරික මෙන්ම සමාජීය තොරතුරු රැසක් භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇති අයුරු සිතියමක පෙන්වා දීමට මෙමගින් කටයුතු කර ඇත. ඒ සඳහා Arc GIS මෘදුකාංග, බාගත කරන ලද ග්ගූගල් චන්ද්‍රිකා ඡායාරූප, මිනින්දොරු දෙපාර්තමෙන්තු සිතියම් මෙන්ම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් විසින් සම්පත් පැතිකඩ සඳහා ලබා දෙන ලද තොරතුරු ද පාදක කර ගන්නා ලදී. එක් එක් සිතියම පාදක කරගත් කෙටි හැඳින්වීමක්, සකසන ලද සිතියමට ඇතුලත් කර ඇති අතර, භූගෝලීය සිතියම් විස්තර සඳහා ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව සතු තොරතුරුද යොදා ගෙන ඇත.

මෙම සිතියම් සංග්‍රහය සම්පාදනයෙහිදී රත්නපුර දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ අරුණි නූපහේවා මහත්මියගේ මගපෙන්වීම, උපදෙස් හා සහයෝගය ඉමහත් පිටුවහලක් විය. GIS තාක්ෂණය පිළිබඳව මා හට අකුරු කළ රත්නපුර දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී ඒ.එම්.ප්‍රේමරත්න මහතාගේ තාක්ෂණික මගපෙන්වීම නොවන්නට මෙම වෑයම සාර්ථක කර ගැනීම අසීරු වනු ඇති අතර, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී සනත් පද්මකුමාර මහතාගේ මගපෙන්වීමත්, ශිල්පීය සහායක ශ්‍යාමලී පීරිස් මහත්මිය විසින් ලබා දුන් සහයෝගයත් කෘතවේදීව සිහිපත් කරමි.

මෙම සිතියම් පොත සම්පාදනයේදී අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම අඛණ්ඩව ලබා දෙමින් මා වඩාත් ධෛර්යමත් කළ කුරුවිට ප්‍රාදේශීය ලේකම් දිලිනි ධර්දාස මහත්මියගේත්, සහකාර ප්‍රාදේශීය ලේකම් ටී.ඩී.නිහාල් මහතාගේත් අධීක්ෂණය නොවන්නට මෙය එළිදැක්වීම අසීරු කාර්යයක් වනු ඇත. කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ සහෝදර නිලධරුවන්ගෙන් මේ සඳහා ලද සහයද හෘදයාංගමව සිහිපත් කරමි. මෙම කාර්යය සඳහා මා හට මානසික අස්වැසිල්ල සලසා දුන් ආදරණීය ස්වාමිපුරුෂයාත්, මාගේ පුතුන් තිදෙනාත් ලෙංගතු හදින් සිහිපත් කරමි. මෙවැනි සහයෝගීතාවයක එකතුවක් වන මෙම සිතියම් සංග්‍රහය අධ්‍යාපනික, ගවේශන, මෙන්ම සැලසුම්කරණ කටයුතු වලදී ප්‍රයෝජනයට ගනිමින් එම කටයුතු වඩාත් ඵලදායීව ඉටු කරනු දැකීම අපගේ සාමූහික ප්‍රයත්නයෙහි සාර්ථකත්වය වනු ඇත......

**ඩබ්.එම්.දීපිකා දමයන්ති කුලසිංහ**
**ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**කුරුවිට**